**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2022 හා 2023**

----------------------------------------------------------------------------------------------------

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2022 හා 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ දෙක සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කරන ලද මෙහෙයුම් අත්පොත් ඡේද අංක 6.6 පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2022 හා 2023 වර්ෂ සඳහා වන මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා 2024 නොවැම්බර් 20 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුර ලබා දී නොමැත. | මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා සකස්කර නියමිත කාලසීමාව තුළදී විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. ගොවිපල ලාභ අලාභ තත්ත්වය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | මණ්ඩලය යටතේ පවතින ගොවිපල 32 අතරින් ගොවිපල දෙකක් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන වශයෙන් පවත්වාගෙන යනු ලබන අතර කිරි බෙදාහැරීමේ/ සකස් කිරීමේ මධ්‍යස්ථානයකින්ද සමන්විත වේ. ගොවිපල ලාභ අලාභ තත්ත්වයන් පිළිබඳ පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (අ) | ගොවිපලවල් අතරින් මාටින්, පොලොන්නරුව, රිදියගම, රොසිටා හා වැලිකන්ද යන ගොවිපලවල 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වාම අඛණ්ඩව අලාභ ලබන තත්ත්වයක පැවතුණි. ඒ අනුව 2023 වර්ෂය ඇතුළුව ගොවිපලවලින් ලබාදී තිබූ සමුච්චිත අලාභය රු.1,280,023,484 ක් වූ අතර මෙසේ දිගින් දිගටම අලාභ ලබන ගොවිපලවල් අලාභ ලැබීමට හේතු සොයා ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මණ්ඩලය විසින් ගෙන නොතිබුණි. | මෙම තත්වය අවමකර ගැනීම සඳහා මේ වන විටත් පස් අවුරුදු සැලැස්මක් සහිත සංයුක්ත සැලැස්මක් සකස්කර ඇති අතර එම සැලැස්මට අනුව කටයුතු කරනු ලැබේ. | අලාභ ලබන ගොවිපලවල් අලාභ ලැබීමට හේතු සොයා ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ |
| (ආ) | ගල් පොකුණ, කොට්ටුකච්චිය ඔයාමඩුව හා වීරවිල යන ගොවිපලවල 2022 වර්ෂය තුලදී ලාභදායී තත්ත්වයක් වාර්තා කර තිබුණද 2023 වර්ෂය තුලදී අලාභදායී තත්ත්වයක් වාර්තා කර තිබුණි. 2023 වර්ෂයේ එම ගොවිපලවල සමුච්චිත අලාභය රු. 44,584,319 කි. තවද එම ලාභ අලාභදායී තත්ත්වයන් අතර සියයට 101 සිට සියයට 1162ක් වූ සැලකිය යුතු මට්ටමේ විචලනයක් ද පැවතුණි. | මෙම තත්වය අවමකර ගැනීම සඳහා මේ වන විටත් පස් අවුරුදු සැලැස්මක් සහිත සංයුක්ත සැලැස්මක් සකස්කර ඇති අතර එම සැලැස්මට අනුව කටයුතු කරනු ලැබේ. | මෙලෙස ලාභ අලාභ විචලනයන්ට හේතු මොනවාද යන්න සොයා බලා අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | මණ්ඩලයේ වැලිසර ගොවිපලේ ක්‍රියාත්මක වන කිරි ව්‍යාපෘතිය තුලින් 2022 වර්ෂයේදී රු. 9,692,514ක් වූ අලාභදායී තත්ත්වයක් වාර්තා කර තිබූ අතර 2023 වර්ෂයේද තත්‍ය අලාභය රු.9,105,012 ක් වී තිබුණි. | 2023 වර්ෂයේ අලාභය රු 9,105,012.39 බැවින් 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ අලාභය අඩුවී ඇත. | දිගින් දිගටම අලාභ ලබන ගොවිපළවල් හඳුනාගෙන එම ගොවිපළවල් ලාභ ලබන තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 2.2. අනුපාත විශ්ලේෂණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබූ 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ මූල්‍ය ප්‍රකාශන අනුව එම වර්ෂ 05 ට අදාළව ගණනය කළ ගිණුම්කරණ අනුපාතයන් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| ජංගම අනුපාතය | 0.75 | 0.59 | 0.62 | 0.75 | 0.99 |
| ක්ෂණික අනුපාතය | 0.49 | 0.38 | 0.36 | 0.48 | 0.55 |
| දල ලාභ අනුපාතය | 27.06 % | 19.09% | 17.91% | 32.29 % | 33.13 % |
| ශුද්ධ ලාභ අනුපාතය | (52.5) % | (10.51) % | (11.58) % | (0.28) % | 4.34% |
| ණය ගැති එකතු කිරීමේ කාලය | දින 32 | දින 28 | දින 25 | දින 25 | දින 19 |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය 2017 වසරේ සිට 2020 වර්ෂය දක්වා අඩු මට්ටමක පැවති අතර 2021 වර්ෂයේදී ඉහළ මට්ටමකට ගොස් තිබුණද ප්‍රශස්ත මට්ටමක නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව මණ්ඩලයේ කාරක ප්‍රාග්ධන ගැටලුවක් ඇති බව නිරීක්ෂණය වේ. | ගොවිපළ නිෂ්පාදන සඳහා යොදාගනු ලබන අමුද්‍රව්‍ය මිල ඉහල යාමත්, එයට සාපේක්ෂව නිමවුම් භාණ්ඩ වල මිල ඉහල නොයැමත් නිසා මෙම තත්වය ඇති වී ඇති අතර කෙසේ වෙතත් ප්‍රාථමික නිෂ්පාදන සඳහා එකතුකළ අගය මත නිෂ්පාදන වැඩිකිරීමට වැඩි අවධානයක් යොමුකර ඇති අතර මෙම තත්වය ඉදිරියේදී මගහැරෙනු ඇතැයි විශ්වාස කෙරේ. | ආයතනයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් ප්‍රශස්ථ ලෙස පවත්වා ගත යුතු වේ. |
| (ආ) | දල ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය 2017 වසරේ සිට 2019 වර්ෂය දක්වා අඩු වෙමින් පැවති අතර 2020 වර්ෂයේ සිට සාධනීය තත්ත්වයක් පෙන්නුම් කර ඇත. | මණ්ඩලයේ ප්‍රධාන නිෂ්පාදනයන් වන පොල්, දෛනික කුකුල් පැටවූ සහ දියරකිරි වල | ආයතනයේ ලාභදායිත්වය වර්ධනය කර ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | | මිල තීරණය වනුයේ රටේ පවතින ඉල්ලුම සහ සැපයුමට අනුව වන අතර විකුණුම් මිල වෙනස් වීම මත දල ලාභයේද විචලනයන් සිදු වේ. මෙම තත්වය මගහරවා ගැනීම සඳහා ඉදිරියේදී ඉදිරි වර්ෂ 05 සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර එහි එකතුකළ අගය මත නිෂ්පාදන වැඩිකිරීමට සැලසුම් කර ඇත. | කළ යුතු වේ. |
| (ඇ) | ණයගැති එකතු කිරීමේ කාලයෙහි සැලකිය යුතු සාධනීය මට්ටමක් පෙන්නුම් කර තිබුණද වර්ෂ පහ ඉක්මවූ ශේෂ එකතු කර ගැනීම සම්බන්ධයෙන් මන්දගාමී තත්ත්වයක් නිරීක්ෂණය විය. | ණයට භාණ්ඩ විකිණීම හා සේවා සැපයීමේදී විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඇතිකර ඇතත් වසර 10-15 ක් පැරණි ණයගැතියන් සඳහා නෛතික ක්‍රියා මාර්ග මේ වන විට ගෙන ඇති අතර අයකර ගත නොහැකි ණයගැතියන් සහ ගිණුම් දෝෂ මත ජනනය වූ ණයගැතියන් පොත්වලින් ලියා හැරීම මේ වන විටත් සිදුකර ඇත.ඉදිරියේදී මෙවැනි ප්‍රමාණාත්මක ණයගැතියන් ජනනය වීමක් සිදු නොවනු ඇත. | හිග ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2014/01 හා 2014 පෙබරවාරි 17 දිනැති චක්‍රලේඛයෙහි 5.2 ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම පදනම් කරගනිමින් පිළියෙල කරන ලද | 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුල ප්‍රසම්පාදන සැලැස්ම හැර අනෙකුත් සැලැස්මවල් ඇතුලත් කර ඇත. ප්‍රසම්පාදන සැලැස්ම | මානව සම්පත් සංවර්ධන සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම හා |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් විය යුතු වාර්ෂික අයවැය ලේඛණය, යෝජිත ප්‍රධාන ආයෝජන, ධාරිතා පුළුල් කිරීම් ද ඇතුළුව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, මානව සම්පත් සැලැස්ම, ණය ආපසු ගෙවීමේ සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුලත් කර පිළියෙල කර නොතිබුණි. තවද මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන කිරි ව්‍යාපෘතිය, ඩිලයිට් ව්‍යාපෘතිය හා වරලත් අලෙවිසැල් හා ප්‍රධාන කාර්යාලයේ පවතින අලෙවිසැල් සම්බන්ධයෙන් අපේක්ෂිත ඉලක්කයන් හා ක්‍රියාකාරකම් පිළිබඳවද ඇතුලත් කර නොතිබුණි. | අදාල කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී මෙම සියලුම සැලසුම් ක්‍රියාකාරී සැලැස්ම තුලට අන්තර්ගත කිරීමට උපදෙස් ලබා දී ඇත. | වාර්ෂික අයවැය ලේඛනය යනාදිය ඇතුලත් කර ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ යුත වේ. |
| (ආ) | 2021 – 2025 සංයුක්ත සැලසුමේ ප්‍රධාන අරමුණු 02 ක් ස්ථාපිත කර තිබූ අතර එම අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාකාරකම් 25 ක් ඇතුලත් කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. ඊට අදාලව 2022 වර්ෂයේ පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රධාන අරමුණු 01 අදාලව ක්‍රියාකාරකම් 05 සම්බන්ධව හා ප්‍රධාන අරමුණු 02 ට අදාලව ක්‍රියාකාරකම් 11ක් සම්බන්ධයෙන් ඉටුකරගත යුතු ඉලක්කයන් එම සැලැස්මෙහි ඇතුලත් කර නොතිබුණි. | 2015 වර්ෂයේදි ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය විසින් 2015.10.21 දින අංක RE/7/216 අප වෙත යොමු කරන ලද ලිපියක් මගින් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් විය යුතු අරමුණු පිළිබඳ දැනුවත් කර ඇත. ඒ අනුව ක්‍රියාකාරි සැලැස්මේ අරමුණු සඳහන් කරන ලද අතර ඒවා 2021 2025 සංයුක්ත සැලැස්මේ අරමුණු සමඟ සම්පූර්ණයෙන්ම සමපාත නොවේ. | එක් එක් ක්‍රියාකාරකමට අදාලව ඉටු කරගත යුතු ඉලක්කයන් සැලැස්මට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | මණ්ඩලය විසින් 2021-2025 වර්ෂ ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබූ අතර නැවතත් 2023-2027 වර්ෂ ආවරණය වන පරිදි සංශෝධිත සංයුක්ත සැලැස්මක් 2023 මැයි 10 වන දින ඉදිරිපත් කර තිබුණි. එම සංයුක්ත සැලැස්ම පදනම් කරගනිමින් 2022 හා 2023 වර්ෂ වෙනුවෙන් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| | (i.) නවීන අභිජනන ශිල්පීය ක්‍රම සහ ගව පශු කළමනාකරණ තාක්ෂණයේ නවතම දැනුම භාවිතා කරමින් වඩා හොඳ පශු සම්පත් කළමනාකරණ පිළිවෙත් සමඟ ප්‍රශස්ත ගබඩා කිරීමේ අනුපාතයක් පවත්වා ගැනීම සඳහා ගව පට්ටියේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම යන ප්‍රධාන අරමුණු යටතේ දේශීය පශු ගොවීන්ට නිකුත් කරනු ලබන අභිජනන ද්‍රව්‍ය එක් එක් සත්ත්ව කාණ්ඩ යටතේ වර්ධනය කිරීමට 2021-2025 | 2021-2025 සංයුක්ත සැලැස්ම සෑදිමේදී රජයේ ප්‍රතිපත්ති අනුව රජය විසින් නැවත වරක් ගවයින් ආනයනය කිරීමට අපේක්ෂා කර තිබූ අතර එබැවින් එම දත්තයන්ද ඇතුලත් කර සංයුක්ත සැලැස්ම පිළියෙල කරන ලෙස උපදෙස් ලබා දි තිබුණි. එබැවින් 2021-2025 සංයුක්ත සැලැස්මේ ගව ව්‍යාපෘතියට අදාල සියළුම ඉලක්කයන් ඉහල අගයකින් | සැලසුම් කළ පරිදි ඉලක්ක ලගා කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. |

සංයුක්ත සැලැස්මට අනුව අපේක්ෂා කර තිබුණි. එම සංයුක්ත සැලැස්මට අනුව 2022 වර්ෂය තුලදී මුළු සතුන් 13,564 ක් අභිජනනය සඳහා දේශීය ගොවීන් වෙත නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද ක්‍රියාකාරී සැලැස්ම තුල එය සතුන් 11,455ක් ලෙස එනම් සියයට 16 ක් පමණ අඩුවෙන් සැලසුම් කර තිබූ අතර සත්‍ය වශයෙන් නිකුත් කළ මුළු සතුන් ගණන 6,761 ක් වූයෙන් සමස්තයක් ලෙස අපේක්ෂිත ඉලක්ක ලඟාකර ගැනීමේ ප්‍රගතිය සංයුක්ත සැලැස්මට අනුව සියයට 49ක් ද ක්‍රියාකාරී සැලැස්මට අනුව සියයට 59ක තරම් වූ අවම මට්ටමක පැවතුණි. තවද 2023-2027 සංයුක්ත සැලැස්මට අනුව 2023 වර්ෂයේදී එළ ගව පිරිමි සතුන් 1388 ක් හා මී ගව පිරිමි සතුන් 384ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද ක්‍රියාකාරී සැලැස්මට අනුව එම ව්‍යාපෘති යටතේ කිසිදු සතකු නිකුත් කිරීමට සැලසුම් කර නොතිබුණු අතර සැලසුම් කර තිබූ ව්‍යාපෘති 06න් ව්‍යාපෘති 05කම ප්‍රගතිය සියයට 6 සිට සියයට 40 තරම් වූ අවම මට්ටමක පැවතුණි.

සඳහන්ව තිබූ අතර 2019 වර්ෂයේ සිට රටෙහි පැවති අර්බුදකාරී තත්වයන් හේතුවෙන් එම සැලසුම් එලෙස ක්‍රියාවට නැංවිය නොහැකි වූ බැවින් 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි එලගව ව්‍යාපෘතියට අදාල ඉලක්කයන් සංයුක්ත සැලැස්මට සාපේක්ෂව අඩු අගයකින් තබන ලදි.

(ii.) 2021-2025 සංයුක්ත සැලැස්මේ දෙවන ප්‍රධාන අරමුණ යටතේ පශු සම්පත් හා කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම යන පරමාර්ථයට අදාළව සංයුක්ත සැලැස්ම අනුව සැලසුම් කරන ලද කෘෂිකාර්මික නිෂ්පාදන වර්ග හයක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. සැලසුම් කරන ලද නිෂ්පාදිතයන්ගේ අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය එළ කිරි නිෂ්පාදනය, කුකුළු මස් පිණිස සතුන් ඇතිකිරීම හා වානිජ කිකිළියන් නිෂ්පාදනය යන නිෂ්පාදිත සම්බන්ධයෙන් සියයට 38 සිට සියයට 58ක් තරම් වූ අවම මට්ටමක පැවතුණි. 2023-2027 සංයුක්ත සැලැස්ම හා 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව එළ කිරි නිෂ්පාදනය, එළු කිරි නිෂ්පාදනය, කුකුළු මස් පිණිස ඇතිකරන සතුන්, වානිජ කිකිළියන් නිෂ්පාදනය හා වටු බිත්තර නිෂ්පාදනය යන අංශයන්ගේ ප්‍රගතිය ක්‍රියාකාරී සැලැස්මෙහි

පාරිභෝගික ඉල්ලුම අඩුවීම හේතුවෙන් වානිජ කිකිලියන් අලෙවිය අඩුවිය. මව් පරම්පරාවේ සතුන් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් වටු බිත්තර නිෂ්පාදනය අඩු වි ඇත. අර්තාපල් හිගය හේතුවෙන් නිෂ්පාදනය කිරීම සීමා විම යනාදී හේතු ඉලක්ක ගත නිෂ්පාදනය අඩු වීමට හේතු විය.

සැලසුම් කළ පරිදි ඉලක්ක ලගා කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| | ඉලක්කගත ප්‍රතිශතයට සාපේක්ෂව සියයට 6 සිට සියයට 58 තරම් වූ අවම මට්ටමක පැවතුණි. | | |
| (iii.) | 2021-2025 සංයුක්ත සැලැස්මේ දෙවන ප්‍රධාන අරමුණ යටතේ මණ්ඩලයේ බලයලත් අලෙවිසැල් සහ සුපිරි වෙළඳසැල් හරහා පශු සම්පත්, කෘෂිකාර්මික සහ සැකසූ නිෂ්පාදන අලෙවිය වැඩි කිරීම උදෙසා ක්‍රියාකාරකම් 12ක් සැලසුම් කර තිබුණද ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම් 07ක් පමණක් සැලසුම් කර තිබුණු අතර එම ක්‍රියාකාරකම් 07න් ව්‍යාපෘති 04ක ප්‍රගතිය සියයට 50කට අඩු මට්ටමක පැවතුණි. තවද 2023-2027 සංයුක්ත සැලැස්මට අනුව මී කිරි නිෂ්පාදනය, අයිස් ක්‍රීම් නිෂ්පාදනය, ඌරු මස් නිෂ්පාදනය හා කිරි නිෂ්පාදන ප්‍රමාණය ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී සියයට 22,33,60 හා සියයට 31 යන ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් සැලසුම් කර තිබූ අතර ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී කිරි ටොෆී නිෂ්පාදනය, යෝගට් නිෂ්පාදනය, UHT කිරි නිෂ්පාදනය හා ඌරු මස් නිෂ්පාදන ප්‍රමාණයන් සියයට 17 සිට සියයට 38 තරම් වූ අවම මට්ටමක පැවතුණි. | පාරිභෝගික ඉල්ලුම අඩු වීම, රටතුල පැවති ඉන්ධන අර්බුදය සහ ආර්ථික දුෂ්කරතා සහ ආනයනික සීම හේතුවෙන් ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය කිරීමට නොහැකි වීම මත ඉලක්ක ලගාකර ගැනීමට නොහැකි විය. | සැලසුම් කළ පරිදි ඉලක්ක ලගා කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. |
| (ඇ) | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ගොවි පුහුණු සැසි 49ක් හරහා ගොවීන් 1600ක් පුහුණු කරවීමට සැලසුම් කර තිබුණ ද සියළුම පුහුණු සැසි ආවරණය කරමින් පුහුණුව ලබා දී තිබුණේ ගොවීන් 530 කට එනම් සියයට 33 කට පමණි. | 2022 වර්ෂයේ රටෙහි පැවති අර්බුදකාරී තත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් සඳහා පැමිණෙන පිරිස සීමා විය. | ඉලක්ක නිවැරදිව පිහිටුවීමටත් එම අපේක්ෂිත ඉලක්ක ලගාකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | දේශීය ඉල්ලුම තෘප්තිමත් කිරීම සඳහා සහ ග්‍රාමීය ආදායම ඉහළ නැංවීම සඳහා අපගේ ගොවීන් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල තුළ තරඟ කිරීමට ධනවත් භාවයට පත් කිරීමේ අරමුණින් පශු සම්පත් නිෂ්පාදන, නිෂ්පාදනය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම යන ප්‍රතිපත්තිය ළගාකර ගැනීම සඳහා 2022 වර්ෂයේ පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රධාන ව්‍යාපෘති 12 ක් යටතේ ක්‍රියාකාරකම් 110ක් සැලසුම් කර තිබුණු අතර ඉන් ක්‍රියාකාරකම් 46ක් ළඟාකරගැනීමේ ප්‍රගතිය සියයට 50කට අඩු | 2022 වර්ෂයේ රටේ පැවති අර්බුදකාරී තත්වයන්, ආනයනික සීමා වීම්, ඩොලරයේ මිල ඉහල යෑම වැනි හේතුන් මත පශු සම්පත් කර්මාන්තය අඛණ්ඩව පවත්වාගැනීමට අවශ්‍ය සත්ව ආහාර, බෙහෙත් වර්ග, අභිජනන ද්‍රව්‍ය, පොහොර ආදිය නිසි ප්‍රමිතියෙන් හා ගුණාත්මක බවින් යුතුව නිසි වෙලාවට සපයා ගැනිමට නොහැකි විය. එබැවින් පශු සම්පත් ව්‍යාපෘති සඳහා | ඉලක්ක නිවැරදිව පිහිටුවීමටත් එම අපේක්ෂිත ඉලක්ක ලගාකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | මට්ටමක පැවතුණි. ඉන් ක්‍රියාකාරකම් 2 ක් වන හංස ව්‍යාපෘති යටතේ වූ එක් ක්‍රියාකාරකමක් හා අභිජනනය සඳහා සතුන් නිකුත් කිරීම යන කටයුතු සම්බන්ධයෙන් ප්‍රගතිය ශූන්‍ය මට්ටමක පැවතුණි. | අවශ්‍ය වන යෙදවුම් වල ගුණාත්මකභාවය අඩු වීම හේතුවෙන් එම ව්‍යාපෘතිවල නිපැයුම්වලද අඩු ප්‍රගතියක් පෙන්වන ලදි. තවද අර්ථික අර්බුදතා හේතුවෙන් පාරිබෝගිකයන්ගේද කිරි හා මස් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ඉල්ලුමද සීමා සහිත වූ බැවින් බෝහෝ අගය එකතු කල නිෂ්පාදනයන් පාරිභෝගික ඉල්ලුම අනුව නිෂ්පාදනය කිරීමට සිදු විය. | |

## 3.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සී/ස කුකුළු පාලන සංවර්ධන සමාගම සම්බන්ධයෙන් 2020 මාර්තු 12 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබාදුන් අංක අමප/20/0890/217/052 දරන 2020 ජුනි 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි දැනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට සියයට 100 ක් කොටස් හිමි සී / ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්) සමාගම විසුරුවා හැරීමටත් , එම සමාගම සතු සියලු වත්කම් හා බැරකම් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට පවරා ගැනීමටත් , එම සමාගම සතු එකම ගොවිපොළ වන මාවත්ත ගොවිපොළෙහි කාර්ය මණ්ඩලය ඔවුන්ගේ අයිතිවාසිකම් රැකෙන පරිදි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත අන්තර්ග්‍රහණය කර ගැනීමටත්, මාවත්ත ගොවිපොළ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපොළක් ලෙසින් පවත්වා ගෙන යාමටත් නියමකර තිබුණු නමුත් සමාගම විසුරුවා හැර සියලු වත්කම් හා බැරකම් පවරා ගැනීම 2024 නොවැම්බර් 20 දින දක්වාම සිදුකර නොතිබුණි. | සී/ස කුකුළු පාලන පුද්ගලික සමාගමේ සේවක මණ්ඩලය 2022.01.01 දින සිට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සේවයට අන්තරග්‍රහණය කරගෙන ඇති අතර මණ්ඩලයේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් සපුරා ගත් දිනයේ සිට ඔවුන් මණ්ඩලයේ තනතුරු සඳහා අනුයුක්ත කර ඇත. මේ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. මෙම සමාගම අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත මත විසුරුවා හැරීමට ලිපි ලේඛන සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමේදී සමාගම් ලේකම්වරුන් අතින් සිදුව ඇති තාක්ෂණික දෝෂයක් හේතුවෙන් ණයහිමියන්ගේ විසුරුවා හැරීමට ප්‍රමාද වී ඇත. ඒ අනුව ප්‍රධාන ණයකරුවෙක් වන ගෝල්ඩ් කොයින් පුද්ගලික සමාගමට රු.13,569,510 ක් ගෙවීමෙන් අනතුරුව ණයහිමියන් ලියා හැරීම අවසන් කර සමාගම ඇවර කිරීම අවසන් වනු ඇත. | සමාගම ඇවර කිරීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමප 15/0940/631/018-1 දරන 2015 ජූලි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමට අයත් සියලුම සම්පත්, වත්කම්, කොටස් හා කළමනාකරණය අදාළ නීතිමය ක්‍රියාවලීන්ට යටත්ව කොටස් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අත් කරගත යුතු බවට දන්වා ඇත. 2021 දෙසැම්බර් 31 දින දක්වා සමාගමෙහි කොටස් අයිතියෙන් සියයට 27 ක් පමණක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අත්කරගෙන තිබුණු අතර සෙසු කොටස් වලින් මහවැලි අධිකාරිය සතුව සියයට 45 ක් ද, නෙදර්ලන්ත පිනැන්සින් සතුව සියයට 23 ක් හා මහවැලි කලාපයේ ගොවීන් සතුව සියයට 05 ක් ද වශයෙන් අයිතිව තිබුණි. 2024 නොවැම්බර් 20 දින දක්වා ම පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත මෙම කොටස් අත්පත් කරගෙන නොතිබුණි. | මහවැලි සත්ව ව්‍යාපාරික සමාගමේ කොටස් අයිතියෙන් 45% ක් මහවැලි අධිකාරිය සතුවන අතර එම සමාගමේ සියළු ඉඩම් වල අයිතියද මහවැලි අධිකාරිය සතු වේ. ඉඩම් අයිතිය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත පවරා කොටස් හිමිකම පවරා දෙන ලෙස මහවැලි අධිකාරියෙන් ඉල්ලීම් 17 ක් ලිඛිතව සිදු කර ඇතත් එම අධිකාරිය විසින් පවරා දීම සම්බන්ධයෙන් කටයුතු කර නොමැත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පවරාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට අය විය යුතු මුළු ණයගැති ශේෂය රු.248,918,006 ක් වූ අතර ඉන් වසර 5 ඉක්මවූ ණයගැති ශේෂය රු.78,885,206 ක් විය. තවද අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගයන් ගනු ලැබූ ණයගැති ශේෂය රු.20,539,520 ක් විය. මෙම නීතිමය ක්‍රියාමාර්ගය ගනු ලැබූ ණයගැති ශේෂය තුළ ගොවිපල වෙතින් අයකර ගත යුතු මුදල රු.14,717,977 ක් වූ අතර ප්‍රධාන කාර්යාලයෙන් අයවිය යුතු මුදල රු.5,821,543 කි. තවද 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු ණයගැති ශේෂය රු.304,390,309 ක් දක්වා වර්ධනය වී පැවති අතර වසර 5 ඉක්මවූ ණයගැති ශේෂය රු.74,389,748 ක් වූ අතර එම ණය ශේෂයන් අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයේ පැවතුණි. | මෙම ණයගැතියන්ගෙන් කිසිසේත් අයකර ගත නොහැකියැයි හඳුනාගත් සේවක ණයගැතියන් රු.247,730 සහ වෙළඳ සහ අනෙකුත් ණයගැතියන් රු.5,361,518 පොත් වලින් ලියා හැරීම සිදුකර ඇති අතර ඉතිරි ණයගැතියන්ගෙන් කොටසක් සඳහා මේ වන විටත් නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ තුළ ඇතුළත් කන්තලේ බඩ ඉරිඟු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ රු 11,947,220 මුදල සම්බන්ධයෙන් පැවැත්වූ නඩු කටයුත්ත අවසන් කර තිබෙන අතර එය අයකරගත නොහැකි බව දන්වා ඇත. ඒ අනුව ඉදිරියේදී පැවැත්වෙන විගණන කමිටු වෙත යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ එකතුව රු.473,078,089 ක් වූ අතර වසර 5 ක් ඉක්මවූ ගෙවිය යුතු ණය වටිනාකම පිළිවෙලින් 2022 හා 2023 වර්ෂ අවසානයට රු.60,276,429 ක් හා රු.50,545,073 ක් විය. | 2022 වර්ෂයේ පවතී ණයහිමි වටිනාකම වන රුපියල් 60,276,429 න් 2023 වර්ෂය වන විට රුපියල් 50,545,824 දක්වා අඩුකර ගැනීමට හැකියාව ලැබී | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | එම ගෙවිය යුතු ශේෂ අතරින් සියයට 99 ක් ම ප්‍රධාන කාර්යාලයට හා ගොවිපොලවලට ගෙවිය යුතු ශේෂ වූ අතර එම ශේෂ 2023 දෙසැම්බර් 31දින දක්වාම නිරවුල් කර නොතිබුණි. | ඇත. මණ්ඩලයේ පවතින මුල්‍ය දුෂ්කරතා හේතුවෙන් මෙය පියවීම ප්‍රමාද වී ඇති අතර ඉදිරියේදී මෙම වටිනාකම පියවීමට කටයුතු කරනු ඇත. | |
| (ඉ) | 2011 වර්ෂයේ සිට වැවිලි මානව සංවර්ධන භාරය වෙතින් අයවිය යුතු රු.3,689,824 ක මුදල අයකර ගැනීමට 2021 දෙසැම්බර් 31 දින දක්වාම ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද අයකර ගැනිමට නොහැකි වී තිබුණි. | මෙම මුදල් අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නීතිමය දෙපාර්තමේන්තුවෙන් විමසීම් කල අතර එහිදී නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලිඛිතව දන්වා ඇත්තේ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය ආයතනකට තවත් රාජ්‍ය ආයතනයකට විරුද්ධව නෛතික ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් නොමැති බවත්ය. ඒ සම්බන්ධයෙන් අදාල බලධාරීන් සමග සාකච්ඡා කර විසඳුම් ලබාගන්නා ලදී. ඒ අනුව මෙම කරුණ රේඛිය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | හිග ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ |
| (ඊ) | 2013 වර්ෂයේ සිට පැවත එන මියගිය ආනයනික ගවයින් වෙනුවෙන් ලැබිය යුතු රක්ෂණ වන්දි රු.19,253,926 ක් 2024 ඔක්තෝබර් 15 දින දක්වාම අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මෙම ගැටළුවට අදාලව දැනට වසර 9 ක් වැනි දීර්ඝ කාලයක සිට ලිපි හුවමාරු වෙමින් පැවතියද විසඳුමක් ලැබී නොමැති බැවින් ඒ සඳහා මැදිහත් විය නොහැකි බව රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දැනුම් දී ඇත. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත ගෙවීමට කිසිදු රක්ෂණ මුදලක් නොමැති බව 2014 දෙසැම්බර් මස 15 වෙනි දිනැති ලිපිය මගින් රක්ෂණ සමාගම දන්වා ඇති අතර රක්ෂණ සමාගම එම ස්ථාවරය වෙනස් කර නොමැත. එසේ හෙයින් ලැබිය යුතු රක්ෂණ වන්දි ලෙස රක්ෂණ සමාගමේ එකගතාවයකින් තොරව ගිණුම් වාර්තා වල දක්වා ඇති රු.19,253,926/- ක වටිනාකම ගිණුම් වල ගැලපිය යුතු වේ. | ලැබියයුතු රක්ෂණ වන්දි අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (උ) | මණ්ඩලය විසින් හා මණ්ඩලයට එරෙහිව සේවක ගැටලු සම්බන්ධ නඩු කටයුතු 02ක්ද මණ්ඩලයේ ඉඩම් පවරාගැනීම සම්බන්ධ නඩු කටයුතු 03ක් ද වෙනත් කරුණු | මෙම නඩු කටයුතු තව දුරටත් විභාග වෙමින් පවතී. | කඩිනමින් නඩු කටයුතු නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

සම්බන්ධ නඩු කටයුතු 26 ක්ද ලෙස මුළු නඩු කටයුතු 31ක් 2023 දෙසැම්බර් 31 දිනට විභාග වෙමින් පැවති අතර ඒ වෙනුවෙන් මණ්ඩලය විසින් 2022 හා 2023 වර්ෂයන් තුලදී  එකතුව රු.570,670 ක් නෛතික වියදම් දරා තිබුණි.

## 3.3. මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ හා මහ බැංකු වාර්ෂික වාර්තා අනුව 2022 හා 2023 වර්ෂ තුළ රටෙහි සමස්ත කිරි නිෂ්පාදනය පිළිවෙලින් ලීටර 506,449,602 ක් හා 504,153,360 ක් වූ අතර පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3,391 ක් හා මිලියන 3,170 ක් විය. 2022 හා 2023 වර්ෂ සඳහා එයින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි නිෂ්පාදනය පිළිවෙලින් ලීටර 7,062,151 ක් හා 5,552,862 ක් වූ අතර පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 18 ක් හා මිලියන 14 ක් විය. ඒ අනුව මණ්ඩලයේ දායකත්වය 2022 හා 2023 වර්ෂවල පිළිවෙලින් කිරි නිෂ්පාදනයෙන් සියයට 1.39 ක් හා 1.10 ක් වූ අතර පොල් නිෂ්පාදනයෙන් සියයට 0.52 ක් හා 0.44 ක් තරම් ඉතා පහළ මට්ටමක පැවතුනි. තවද ඇසුරුම් කළ දියර කිරි වෙනුවෙන් වෙළඳපල තුළ ඉහළ ඉල්ලුමක් ඇති අතර අනෙකුත් තරඟකාරී ආයතන එම වෙළඳපල අවශ්‍යතා හඳුනාගෙන කටයුතු කළද ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය රටෙහි ප්‍රධානතම කිරි නිෂ්පාදකයා වුවත් එවැනි අවස්ථා උපයෝජනය තුලින් වර්තමාන කාලයට ගැලපෙන පරිදි කටයුතු කර වෙළඳපල කොටස වර්ධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | ශ්‍රී ලංකාවේ වාර්ෂික කිරි නිෂ්පාදනය කිරි ලීටර් මිලියන 400 පමණ වන අතර අප මණ්ඩලයේ වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 7 ක් පමණ වේ. ඒ අනුව රටේ කිරි නිෂ්පාදනය සඳහා දායකත්වය 1.75% පමණ වේ. මණ්ඩලයේ කිරි නිෂ්පාදනය රටේ නිෂ්පාදනයේ විශාල ප්‍රතිශතයක් ලෙස ඉහල නැංවීම ප්‍රයෝගික නොවේ.<br>එනම් කිරි නිෂ්පාදනය දෙගුණ කලද එය රටේ නිෂ්පාදනයෙන් 3.5% ක් පමණ වනු ඇත. එසේ නමුත් පවතින සම්පත් උපරිමයෙන් භාවිතා කරමින් සීමිත මූල්‍ය හැකියාවන් මත හැකි උපරිමයෙන් තවදුරටත් නිෂ්පාදනය ඉහල නැංවීමට පියවර ගනු ලැබේ.<br>2022-2023 වර්ෂ වල පොල් වගාවට බලපාන ලද මයිටා හා සුදුමැස්සාගේ හානිය, රසායනික පොහොර හිඟතාවයද හේතුවෙන් පොල් නිෂ්පාදනය අඩුවිය.<br>ඇසුරුම් කල දියර කිරි සඳහා අවශ්‍ය ඇසුරුම් ද්‍රව්‍ය රටෙහි පැවති ආනයනික සීමා හේතුවෙන් ආනයනය කිරීමට අපහසු වූ බැවින් නිෂ්පාදනය සීමාසහිත විය. | නිෂ්පාදනයන් තවදුරටත් වර්ධනය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | සාධාරණ මිලට හොඳ තත්ත්වයේ ගොවිපල නිෂ්පාදන සැපයීම සඳහා අලෙවි සැල් ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකමක් වශයෙන් | මෙම අලෙවිසැල් වල ආදායම් තත්වය ඉතාමත් අඩු තත්වයක තිබූ අතර එම අලෙවිසැල් පවත්වාගෙන යාම දිගින් දිගටම | වෙළෙඳපොල කොටස නිවැරදිව අධ්‍යයනයක් සිදු කර අලෙවිසැල් |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලය විසින් හඳුනාගෙන තිබුණද ක්‍රියාත්මක තත්ත්වයේ පැවති වෙළඳසැල් 05ක් 2022 හා 2023 වර්ෂ තුලදී වසා දමා තිබූ අතර කඳාන ප්‍රදේශයේ රෝහලක නව අලෙවිසැලක් පමණක් ආරම්භ කර තිබුණි. | අලාභාදයක තත්වයක පැවතුනි. එම නිසා එම අලෙවිසැල් 2022 සහ 2023 වර්ෂ වලදී වසා දැමීමට කටයුතු කරන ලදී. මේ වන විට වෙරහැර අලෙවිසැල බාහිර පාර්ශවයක් වෙත මාසිකව බදු පදනම මත ලබාදී ඇති බවද කාරුණිකව දන්වා සිටින අතර කඳාන ප්‍රදේශයේ රෝහලෙන් කල ඉල්ලීමකට අනුව අනුව එම රෝහලේ අලෙවිසැලක් අලුතින් ආරම්භ කර ඇත. | ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සතුන්ගේ සාන්ද්‍ර ආහාර සඳහා වැය වන අධික පිරිවැයට පිළියමක් ලෙස මණ්ඩලය විසින් සත්ත්ව ආහාර නිෂ්පාදනාගාරයක් 2020 වර්ෂයේදී වීරවිල ගොවිපලෙහි ආරම්භ කල බව මණ්ඩලය විසින් රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ  කාරක සභාවට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලද කාර්යයසාධන වාර්තාවක සඳහන් කර තිබුණද වර්තමානය වන විට එම නිෂ්පාදනාගාරය ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින අතර 2022 හා 2023 වර්ෂ සඳහා මණ්ඩලය විසින් බාහිර පාර්ශවයන්ගෙන් ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් පිළිවෙලින් රු.1,387,848,584ක් හා රු.1,388,644,393 ක් සත්ත්ව ආහාර වෙනුවෙන් වැයකර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | නිෂ්පාදන පිරිවැය අවම කිරීමට හැකි වන පරිදි අවශ්‍ය සත්ව ආහාර අවම පිරිවැයක් යටතේ සපයා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

**3.4. නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළ 4 ක් සතුව දිනකට එක් වරකදි ගව ආහාර ටොන් 3.75 ක් නිෂ්පාදනය කළ හැකි යන්ත්‍ර 4ක් පවතී. ඒවායින්  මසකට ගව ආහාර මෙ.ටො 900 (3.75*දින 30* පැය 8) ක් වන ලෙස වර්ෂයකට මෙට්‍රික් ටොන් 10,800 ක් නිෂ්පාදනය කළ  හැකි වුවද එම යන්ත්‍ර වසර 01 සිට වසර 14 දක්වා කාලයක් නිෂ්කාර්යව පවතින බව අනාවරණය  විය. | මෙම යන්ත්‍ර අඩු ධාරිතාවයකින් හා පැරණි උපකරණ වන බැවින් ඒවායේ කාර්යක්ෂමතාවය සාපේක්ෂව අඩු වන අතර එම යන්ත්‍ර භාවිතයෙන් සත්ව ආහාර නිපදවීමේදී නිෂ්පාදන ඒකක පිරිවැය වැඩිවීමට හේතු වේ. එය අදාල ව්‍යාපෘති වල ලාභය කෙරෙහි ඍජුව බලපාන අතර පැරණි යන්ත්‍රෝපකරණ විධිමත් ලෙස භාවිතා කිරීම හා කාර්යක්ෂම යන්ත්‍ර ඉදිරියේදී මිලදී ගෙන අහාර නිෂ්පාදනයට භාවිතා කිරීම සිදු කර ඇත. | නිෂ්කාර්ය යන්ත්‍ර ඵලදායීව උපයෝජනය කිරීම සහ උපයොජනය කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවේනම් විධිමත්ව අපහරණය කර වඩාත් කාර්යක්ෂම යන්ත්‍ර මිලදී ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ වන ගොවිපොළ 4 ක් සතුව කුකුළු ආහාර සකස් කිරීමේ යන්ත්‍ර 04 ක් ඇත. ඊට අමතරව මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම සතුව කුකුළු ආහාර සකස් කිරීමේ ඇඹරුම් හා මිශ්‍රණ යන්ත්‍ර 1 ක් ද , ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම සතුව කුකුළු ආහාර සකස් කිරීමේ ඇඹරුම් හා මිශ්‍රණ යන්ත්‍ර 2ක්ද පවතී. මෙයින් කුකුළු ආහාර මසකට මෙට්‍රික් ටොන් 2,580 (10.75*දින 30* පැය8) ක් වන ලෙස වර්ෂයකට මෙට්‍රික් ටොන් 30,960 ක් නිෂ්පාදනය කිරීමේ හැකියාව පවතී. නමුත් 2021 දෙසැම්බර් 31 දිනට එම යන්ත්‍ර 8 වසර 01 සිට වසර 14 දක්වා කාලයක් නිෂ්කාර්යව පවතින බව නිරක්ෂණය විය. | මෙම යන්ත්‍ර අඩු ධාරිතාවයකින් හා පැරණි උපකරණ වන බැවින් ඒවායේ කාර්යක්ෂමතාවය සාපේක්ෂව අඩු වන අතර එම යන්ත්‍ර භාවිතයෙන් සත්ව ආහාර නිපදවීමේදී නිෂ්පාදන ඒකක පිරිවැය වැඩිවීමට හේතු වේ. එය අදාල ව්‍යාපෘති වල ලාභය කෙරෙහි සෘජුව බලපාන අතර පැරණි යන්ත්‍රෝපකරණ විධිමත් ලෙස භාවිතා කිරීම හා කාර්යක්ෂම යන්ත්‍ර ඉදිරියේදී මිලදී ගෙන ආහාර නිෂ්පාදනයට භාවිතා කිරීම සිදු කර ඇත. | නිෂ්කාර්ය යන්ත්‍ර ඵලදායීව උපයෝජනය කිරීම සහ උපයෝජනය කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවේනම් විධිමත්ව අපහරණය කර වඩාත් කාර්යක්ෂම යන්ත්‍ර මිලදී ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. |

## 3.5. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට හා 2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ ප්‍රධාන තනතුරු වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු 02 ක් හා සහකාර සමාන්‍යාධිකාරි තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතුණු අතර මණ්ඩලීය ගොවිපල කටයුතු යථාවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රධාන තෘතියික මට්ටමේ තනතුරක් වන ගොවිපල කළමනාකරු තනතුරු 28 න් තනතුරු 20 ක් හා 22 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩුව පවතින තනතුරු සඳහා දැනට මණ්ඩලයේ සිටින ජ්‍යෙෂ්ඨ නිළධාරින්ට වැඩ බැලීම සඳහා තනතුරු ලබා දී ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට හා 2023 දෙසැම්බර් 31 දිනට ද්විතියික මට්ටමේ මුළු අනුමත සේවකයින් ගණන 361 ක් වූ අතර ඉන් 154 ක් අනුමත කළමනාකරණ සහකාර තනතුරු වූ අතර 2022 හා 2023 වර්ෂ වලදී පිළිවෙලින් එම කාණ්ඩයේ සේවකයින් 24ක් හා 02 ක අතිරික්තයක් පැවතුණි. තවද ප්‍රාථමික අංශයේ රියදුරු තනතුරු 01 ක් ද ට්‍රැක්ටර් ක්‍රියාකරු තනතුරු 09 ක්ද 2023 දෙසැම්බර් 31 දිනට අතිරික්තව පැවතුණි. | 2022 හා 2023 වර්ෂවල කළමනාකරණ සහකාර තනතුරු වල අතිරික්තයක් පැවතියද දැනට අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව සිටිය යුතු කළමනාකරණ සහකාර සංඛ්‍යාව වන 154 සේවයේ යෙදී සිටී.<br>2023 වර්ෂයේ රියදුරකුගේ අතිරික්තයක් පැවතියද දැනට රියදුරු 05 ක ඌනතාවයක් පවතී. ගොවිපල් වල ක්ෂේත්‍රයේ කටයුතු වල ස්වභාවය අනුව වෙක්රෝල් ට්‍රැක්ටර් ක්‍රියාකරු තනතුරු සඳහා බඳවාගෙන ඇති බැවින් එම තනතුරේ අතිරික්තයක් පෙන්නුම් කලද වෙක්රෝල් | සේවක අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | | කම්කරු තනතුරේ ඌනතාවයක් පවතී. වෙක්රෝල් කම්කරුවන්ගේ රාජකාරි අතිරික්ත ට්‍රැක්ටර් ක්‍රියාකරුවන් මඟින් ඉටුකර ගනියි. |
| (ඇ) | ප්‍රාථමික මට්ටමේ නුපුහුණු සේවකයන් යටතේ අනුමත මුළු සේවක පිරිමි 25 ක් වුවද තත්‍ය වශයෙන් සේවකයින් 72ක් සේවයේ නියුක්තව සිටි අතර ඉන් 55 ක්ම විකුණුම් සහකරුවන් ලෙස සේවයේ යොදවා තිබුණි. | 2003 වර්ෂයේ සිට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් දියර කිරි ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ පවත්වාගෙන යන කිරි අලෙවිසැල් සඳහා වෙක්රෝල් පදනම මත අලෙවි සහායකයින් බඳවා ගෙන ඇති අතර ඔවුන් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කාර්ය දර්ශකයක් අනුමත කර නොමැත. එසේ වුවද සේවා අවශ්‍යතාවය මත ඔවුන් සේවයේ යෙදී සිටින අතර 2015 වර්ෂයේ අයවැය යෝජනාවන්ට අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 හි සඳහන් පරිදි දින 180 ට වැඩි සේවා කාලයක් සපුරා ඇති අය සඳහා ස්ථිර පත්වීම් ලබාදීම මත මෙම අලෙවි සාහයකයින්ගේ සේවය ස්ථිර කර ඇත. ඒ අනුව අලෙවි සහායකයින් 55 දෙනෙකුගේ අතිරික්තයක් පෙන්නුම් කරයි. |

### 3.6. වාහන පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් සමාජ සේවා සුභසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහන 21ක්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් වාහන 22 ක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් වාහන 37 ක්, හදිසි උතුරු ප්‍රතිසාධන ව්‍යාපෘතියට අයත් වාහන 01 ක් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයට අයත් වාහන 01ක්, කෘෂිකර්ම හා පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් වාහන 04 ක්, කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වාහන 02 ක්, පශු සම්පත් සංවර්ධන හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයට අයත් වාහන 01ක් යනාදී වශයෙන් කැබ් | මෙම වාහන පවරා ගැනීමට අදාල ක්‍රියාමාර්ග ගෙන ඇත. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් වාහන 37 ක ලියාපදිංචි හිමිකාරිත්වය ලබාගැනීමට වාහන පැවරුම් ආකෘති පත්‍ර යොමුකිරීමට කටයුතු යොදා ඇත.<br>සමාජ සේවා සුභසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහන 21න් HP-2334 ලියාපදිංචි අංක දරන නිශාන් පෙට්‍රල් වර්ගයේ ජීප් රථය රේඛීය අමාත්‍යාංශයේ පශු සම්පත් | පවරා ගැනීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතුය. |

| | | |
|---|---|---|
| රථ, යතුරු පැදි, ට්‍රැක්ටර්, ට්‍රේලර්, ලොරි රථ, ජීප් රථ ලෙස එකතුව වාහන 89 ක් භාවිතා කරන අතර 2023 දෙසැම්බර් 31 දක්වාම එම වාහන පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම වාහන කිහිපයක් සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී රු.2,738,868 ක් හා 2023 වර්ෂයේදී රු.5,058,283ක් වශයෙන් අළුත්වැඩියා වියදම් දරා තිබුණි. | අංශයෙහි ප්‍රවාහන අංශය වෙත භාරදීම සඳහා කටයුතු පිළියෙල කර ඇත. අමාත්‍යාංශය නමින් ලියාපදිංචි හිමිකම ඇති බජාජ් CT 100 වර්ගයේ යතුරුපැදි 20 න් යතුරු පැදි 5 ක් තක්සේරු කර එහි වටිනාකම ගෙවා ලියාපදිංචි හිමිකම මණ්ඩලය වෙත ලබා ගැනීමට කටයුතු සිදුකර ඇති අතර එක් යතුරු පැදියක් VH-4701) අපහරණ තත්වයේ පවතින බවත් ඉතිරි යතුරුපැදි 14 පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටු

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ යහපාලනය සඳහාවූ මඟපෙන්වීම් අත්පොතේ 4 වන පරිච්ඡේදයේ 1.2 (ඌ) වගන්තිය ප්‍රකාරව සෑම මාස 3 කට වරක් විගණන කමිටුවක් පැවැත්විය යුතු බවත් එහිදී ගනු ලබන නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලයට යැවිය යුතු බවත් සඳහන් වුවද මණ්ඩලය විසින් 2022 වර්ෂයට අදාලව පවත්වා තිබුණේ එක් විගණන කමිටු රැස්වීමක් පමණි. | **භාණ්ඩාගාර නියෝජිතවරයා** විගණන කමිටුවේ සභාපති බැවින් ඔහුගේ රාජකාරි බහුල වීම, සහ නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් කමිටුව විධිමත්ව පැවැත්වීමට නොහැකි විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |